# පුරාණයේ සහ වර්තමානයේ සරණමංගල්‍යය හා විවාහචාරිත්‍ර විධි

ආර්.එම්.එස්.ඩී. රත්නායක[1], පී.කේ.ඒ ප්‍රසංගා[2]

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
[1]sagarikadilani99@gmail.com, [2]amaliprasanga94@gmail.com

ප්‍රමුඛපද: සරණමංගල්‍යය, විවාහය, පෝරුවේ චාරිත්‍ර

## හැඳින්වීම

සරණ මංගල්‍යය යනු විවාහ මංගල්‍යයකි. සරණ බන්ධනය යනු විවාහ බන්ධනයයි. ඒ අනුව විවාහය යනු එකිනෙකා කෙරෙහි අන්‍යෝන්‍ය වශයෙන් බැඳි විවාහ ධර්මතාවයන් රකිමින් ප්‍රජාව බිහිකර පෝෂණය කිරීමේ ඒකකයයි. විවාහ මංගල්‍යයේ ඓතිහාසික පසුබිම සැලකිල්ලට ගැනීමේදී පැරණි සාම්ප්‍රදායික හා නූතන සංකීර්ණ සමාජවල විවාහයේ ස්වරූපය හා හැඩය වෙනස්වන බව පෙනීයයි. ඊට හේතුව විවාහය සමාජවල සංස්කෘතික හා ආගමික පදනමක් මත ක්‍රියාත්මක වන හෙයිනි. ඒ ඒ සමාජ සන්දර්භය අනුව විවාහය ද හැඩගැසී ඇත. මේ අනුව සරණ මංගල්‍යය යන්නට නිසියාකාර නිර්වචනයක් ලබාදිය නොහැකි නමුත් විවිධ විද්වතුන් විවිධ අදහස් එලකර තිබේ. මීට අතිරේකව මධ්‍යතන යුගයෙහි සිංහල ව්‍යවහාරයට එකතු වූ වචනයක් ලෙස, **"කසාද බැඳීම"** යන්න සලකනු ලැබේ. මෙය ඉතාලි, පෘතුගීසි ආදී භාෂාවලින් කසා (casa), කසාදොස් (casados) සහ කසාර් (casar) යන වචනවලින් තත්භව වී පෘතුගීසි පාලනසමයේ පටන් භාවිත වන්නට විය.

මෙලෙස ජනයා අතරට එක්වූ විවාහයේ විවිධ වර්ගයන් නොහොත් ක්‍රමයන් අතීතයේ පටන් දක්නට ලැබේ. එනම්,

1. දීග විවාහය
2. බින්න විවාහය
3. නෑනා-මස්සිනා විවාහය
4. බහු-භාර්යා විවාහය යනුවෙනි.

මේ සියලු ම විවාහයන් සිදු කර ඇත්තේ පස්වැදෑරුම් උත්සව මාලාවකිනි. මෙය පංච මඟුල නොහොත් පස් මඟුල යැයි නම්කරනු ලැබේ. එනම්,

1. සටහන්ගෙඩි මඟුල
2. කටබස් මඟුල
3. බත්කෑමේ මඟුල
4. සුබ මඟුල
5. කත්බැඳි මඟුල

මෙසේ පස්වැදෑරුම් උත්සව මාලාවකින් අතීත ලංකාවේ විවාහ චාරිත්‍ර සිදු කර තිබේ. මධ්‍යතන යුගයේ අවසාන අවධිය වූ සෙංකඩගල මහනුවර අවධියේදී එනම්, ක්‍රි.ව. 1769-1815 අතර කාලයේදී රචිත බව සැලකෙන නීති නිඝණ්ඩුවෙහි ද බිණි විවාහය හා දෙවැදෑරුම් විවාහක්‍රමයන්හි අනුගමනය කළයුතු චාරිත්‍ර දක්වා තිබේ.

## අරමුණ

වත්මන වනවිට අපේ පෞරාණික විවාහ චාරිත්‍ර සමාජයෙන් වියැකීයමින් පවතී. එවැනි තත්ත්වයක් හමුවේ අපට පාරම්පරිකව උරුම වූ විවාහ චාරිත්‍රවාරිත්‍ර

විධික්‍රම පිළිබඳ වත්මන් හා අනාගත පරම්පරාවට අවබෝධයක් ලබාදීම මෙයින් අපේක්ෂිතය.

### අධ්‍යයන ක්‍රමවේද

සම්මුඛ සාකච්ඡා හා ග්‍රන්ථ පරිශීලනය ප්‍රමුඛ වූ අධ්‍යයන ක්‍රමවේද ඔස්සේ පුරාණ හා වත්මන් සරණ මංගල්‍යය හා විවාහ චාරිත්‍ර විධික්‍රම පිළිබඳ අධ්‍යයනය කළෙමු.

### අන්තර්ගතය

වර්තමාන ශ්‍රී ලාංකේය බෞද්ධ ග්‍රාමීය සමාජ රාමුව තුළ ආවාහ විවාහ මංගලෝත්සවයට විශේෂ ස්ථානයක් හිමිවේ. මෙය සාමාන්‍ය ව්‍යවහාරයේ දී දෙවැනි උපත සිදුවන අවස්ථාවසේ සලකනු ලැබේ. මෙහිදී දෙවන උපතක් ලෙස විවාහය සලකනු ලබන්නේ මනාලිය හෝ මනාලයා හෝ තමා හැදීවැඩුණු පරිසරයෙන් මිදී වෙනස්ම සමාජරටාවකට හුරුවෙමින් අනාගත පරම්පරාවක් දායාද කිරීම උදෙසා ක්‍රියාකරන බැවිනි. ඒ අනුව අනාදිමත් කාලයක සිට ආරක්ෂාකරගෙන එනු ලබන සිරිතට අනුව වර්තමානයේ මූලික අවස්ථා තුනක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,

1. විවාහ මංගලෝත්සවයට පූර්ව අවස්ථාව

2.මනාලියගේ පාර්ශවයේ විවාහ මංගලෝත්සව අවස්ථාව

3.මනාලයාගේ පාර්ශවයේ ආවාහ මංගලෝත්සව අවස්ථාවයි.

මුලින්ම කපුමහතෙකු ලවා මඟුල් තුලාව කතාකර ඉන්අනතුරුව කේන්දර බලා පොරොන්දම් ගැලපේ නම් එතැන් පටන් මංගල චාරිත්‍ර ක්‍රියාදාමය සිදුවේ. විවාහ මංගලෝත්සවයට පූර්ව අවස්ථාවේ වැදගත් චාරිත්‍ර තුනක් සිදුවේ. එනම්,

1. බැලීමට යාම හෙවත් පළමු වැනි ගමන

2. නැකැත් ගෙනයාම

3. නම් දීම හෙවත් නැකත් දීම යනුවෙනි.

මනමාලියගේ පාර්ශවය ද විවාහ මංගලෝත්සව අවස්ථාවට පෙර කළයුතු සිරිත් කිහිපයකි. එනම්, මෙය උභය පාර්ශවයටම පොදුචාරිත්‍ර ද වේ.

1. මඟුලට බුලත් දීම

2. මංගල මඩු සකස් කිරීම

3. තෙල් තාච්චිය ලිප තැබීම

ඉන් අනතුරුව මංගල දිනය දවසේ දී මනමාලයා පෙරටු කොටගෙන මනාල පාර්ශවයේ ඥාතීන්ගේ පැමිණීම සිදුවන අතර මනමාලියගේ නිවස වෙතට පැමිණි පසු මනමාලයාගේ පා සේදීමෙන් අනතුරුව මනමාලයාට ගමන්කිරීමට සුදුසු පාවඩයක් එළීමෙන් අනතුරුව ආශිර්වාද ගී ගායනා කළපසු මනමාලයා පාවඩය මතින් නිවස වෙත පැමිණේ. මින්පසු ප්‍රධාන චාරිත්‍රයක් ලෙස කාගෙත් නෙත්සිත් ඇදබැඳ තබා ගන්නාමෙන් ම වැදගත් ම චාරිත්‍රය වන්නේ පෝරුවේ චාරිත්‍ර ඉටුකිරීමයි. එහිදී පෝරුව වටා සතරවරම් දෙවියන් වෙනුවෙන් පහන් දල්වනු ලැබේ. පොරුවේ චාරිත්‍ර අතර ද අතුරු චාරිත්‍ර චාරිත්‍ර ගණනාවක් අන්තර්ගත වේ. ඒ අතර ස්තෝත්‍ර ගායනය, බුලත්හුරුළු දීම, තැළි පිළි පැළඳවීම, අතපැන් වත්කිරීම ආදිය වේ.

මෙහිදී මනාලියගේ මාමා විසින් යුවතිපතීන්ගේ සුළැඟිලි පිරිත් නූලකින් බඳිනු ලබනකල්හි ස්තෝත්‍රකරු විසින්,

"සබ්බේ බුද්ධා බලප්පත්තා

පච්චේකානං ච යංබලං

අරහන්තානං ච තේජේන

රක්ඛං බන්ධාමි සබ්බසෝ "

යන ගාථාව තෙවරක් සජ්ඣායනා කරනු ලැබේ. මෙහිදී සැමගේ ම ඇසට කඳුළක් නැගෙන චාරිත්‍රය වන්නේ කිරිකඩසේලය පිදීමයි. මවක් විසින් දසමසක් කුසදරමින් දියණිය සියදිවියමෙන් රැකගෙන උපන් දා සිට ආරක්ෂාකර හදාවඩා ශිල්පශාස්ත්‍ර සිරිත්විරිත් ආදිය මඟින් හික්මවා කුල කුමරියක ලෙස කුමරිබඹසර රැක කුල පරපුරේ ගෞරවය රැකගෙන පිටමන්කරනු ලබන්නේ මෙදින ය. ඒ සියල්ලට ගෞරව දැක්වීමේ සංකේතයක් ලෙස මෙම චාරිත්‍රය සිදුකරනු ලැබේ.

මෙම පෝරු චාරිත්‍රවලින් අනතුරුව මංගල කිරිබත කපා එදින ගෙවා අවසන මංගල සමුළුව රැස්ව කතාබස්කර යුවතිපති දෙපළ නෑදෑයින් වැඳ මඳුසමය සඳහා පිටත්වෙති. එහිදී ආවාහ මංගල දිනයේ දී මනාලිය කැන්දාගෙන එන අතර ඔවුන් මනමාලයාගේ මව විසින් පිළිගනු ලැබේ. නිවසට පාවඩයක් එළා ඔවුන් ඒ මතින් කැදවති. පොල්තෙල් පහන් දල්වා, කිරිබත කපා, තේපැන් සංග්‍රහ භුක්තිවිඳ, පවුලේ සැමට බුලත්හුරුළු දී ආචාර දක්වති. මනමාලයා මනමාලියගේ දෙමව්පියන්ට තෑගි පිරිනමනු ලැබේ.

අවසාන වශයෙන් මනාලියගේ දෙමාපියන් විසින් මනමාලයාගේ දෙමාපියන්ට සිය දියණිය භාරකරනු ලැබේ. අනතුරුව මනමාලියගේ පාර්ශවයෙන් ස්තුති පිරිනමා කතාපවත්වා මනමාලයාගේ නිවසින් පිටව යති. මේ අන්දමට අතීතයේ සිට වර්තමානය දක්වා ආවාහ විවාහචාරිත්‍ර ක්‍රමානුකූලව පාරම්පරිකව සම්ප්‍රේෂණය වී ඇත. මෙමගින් ශිෂ්ටාචාරයක ආධ්‍යාත්මික චින්තනයත්, දේශීය අනන්‍යතාවයත්, ආර්ය සභ්‍යත්වයත් කැටි කරගත් ගිහි ජීවිතයේ ආගමික මංගල්‍යය විවාහෝත්සවය ලෙස වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම පෙන්වාදිය හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ


පූජ්‍ය ලියනේගම, චන්දසිරිහිමි. (2006)***හෙළ සිරිතයි විවාහයයි***. කර්තෘ ප්‍රකාශනයකි.

මනුරත්න, එම්. ජී. (2004)***ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා පවුල***. වරකාපොලඃ ආරිය ප්‍රකාශකයෝ.